**මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 - 2024**

**-------------------------------------------------------------------**

## 1. විගණන මතය

**1.1** මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22කට අදාළව වාර්තා නිකුත් කර තිබුණු විගණන වාර්තා 22හි තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 22 විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත වියයුතු සංරචකයන් අතුරෙන් ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ආකෘතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 22 හිම ඇති ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් දේපල, පිරියත හා උපකරණ වලට අදාලව පිරිවැය, සමුච්චිත ක්ෂය සහ ශුද්ධ අගය දැක්වෙන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දෙන ලද ගිණුම් වාර්තා ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් වල පිරිවැය වාර්ෂික එකතු කිරීම් වාර්ෂික ක්ෂය, සමුච්චිත ක්ෂය හා ශුද්ධ අගය සඳහාත් ආකෘතිය මධ්‍යස්ථාන 22හිම සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය වාරතා පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාරක සභා 12ක, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදා ගත් එකතුව රු.72,159,387කට අදාළ වූ ජර්නල් සටහන් 257ක් එම කාරක සභාවල අදාළ විධායක ලේකම්වරුන් විසින් අනුමත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදාගත් ජ'නල් සටහන් පසුව විධායක ලේකම් විසින් අනුමත කර ඇති බව | ජ'නල් සටහන් යොදන අවස්ථාවේදීම ඒවා අනුමත කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඹුරුපිටිය, විල්පිට, තලල්ල, දෙයියන්දර, අකුරැස්ස, බෙරලපනාතර, වැලිගම සහ දංදෙනිය යන කාරක සභා 08 ට අයත් පර්චස් 1,327ක් වූ ඉඩම් කැබලි 08 ක්, මැදඋයන්ගොඩ, මිරිස්ස, දෙනියාය, හක්මණ, කනංකේ, පස්ගොඩ, රන්සෑගොඩ, මාලිම්බඩ, කැකනදුර, දික්වැල්ල, මඩිහගොඩගම, මොරවක සහ ඌරුබොක්ක යන කාරක සභා 13 ක ප්‍රමාණය දක්වා නොමැති ඉඩම් කැබලි 13 ක්, එකතුව වර්ග අඩි 45,340 ක් වූ කාර්යාල ගොඩනැගිලි 12 ක් වෙනත් ගොඩනැගිලි 28 ක් සහ වර්ග ප්‍රමාණය දක්වා නොතිබූ කාර්යාල ගොඩනැගිලි 10 ක් වූ ස්ථාවර වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | දැනට ස්ථාවර වත්කම් ගණනය කර ඇති අතර ඒවා ගිණුම්ගත කිරීමට අවශ්‍ය වටිනාකම් දැනට මධ්‍යස්ථානය වෙත යවා ඇති අතර ලබන වසරේ සිට ගිණුම් වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | කාරක සභාවන්ට අයත් ස්ථාවර වත්කම් සියල්ල තක්සේරු කර ගිණුම්ගත කිරීමත්, මූල්‍ය ප්‍රකාශන වලින් ඒවා ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මඩිහගොඩගම, කඹුරුපිටිය සහ බෙරලපනාතර ගොවිජන සේවා කාරක සභාවල එකතුව පිළිවෙලින් රු.108,685ක්, රු. 20,596ක් සහ රු. 49,467ක් වූ ගොවි බැංකු වියදම් කාරක සභාවේ වියදම් ලෙස ගිණුම් තැබීම නිසා එම කාරක සභාවල වර්ෂයේ ලාභය එකතුව රු.178,748 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගොවි බැංකුවල වියදම් ගොවිජන සේවා කාරක සභා වලින් වියදම් දැරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 436/99 හා 1999.11.25 දිනැති චක්‍රලේඛනයේ 10.1 මඟින් උපදෙස් දී ඇත. | කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළ ගොවිජන බැංකුවල සමස්ථ ක්‍රියාකාරීත්වය හා කාර්යසාධනය නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඇ) | මඩිහගොඩගම ගොවිජන සේවා කාරක සභාවේ අංක 1660275 දරන ජංගම ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු. 262,853ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ | මෙම බීජ හා අත්තිකාරම් ගිණුම වසා අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇති බවත් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වත්කම් ලෙස ගිණුමේ ශේෂය ඇතුළත් කළ යුතු අතර ගනුදෙනු සිදුකළ මාසවල බැංකු |

| | | | |
|---|---|---|---|
| | ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර 2020 ජූලි 31 දිනෙන් පසු මේ දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ හෝ පිළියෙල කර නොතිබුණි. | පියවර ගන්නා බවත් දැනට ජංගම ගිණුමේ පවතින ශේෂය රු.160,853 ක් බව | සැසඳුම් වාර්තා පිළියෙල කළ යුතුය. |
| (ඇ) | රන්සැගොඩ, කඹුරුපිටිය, පස්ගොඩ, අකුරැස්ස, හක්මණ සහ බෙරලපනාතර ගොවිජන සේවා කාරක සභාවල පසුගිය වර්ෂවලට අදාළව එකතුව රු.334,423 ක් වියදම්, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | වියදම් වර්ෂයට අදාළව හඳුනාගෙන ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | කනංකෙ ගොවිජන සේවා කාරක සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනා ගෙන තිබූ, 2020 ජනවාරි 16 දින රු.22,410 කට මිලදී ගෙන තිබූ ඇඹිලි සළකුණු යන්ත්‍රය, ගිණුම්ගත කර නොතිබූ අතර ක්ෂය ගැලපීම ද සිදුකර නොතිබුණි. තවද එය සමාලෝචිත වර්ෂයේදී ඉන්වෙන්ට්‍රිගත කර හෝ නොතිබුණි. එමෙන්ම, මාලිම්බඩ ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේදී රු.60,000 ක් වැය කර මිලට ගෙන තිබූ ඇඹිලි සලකුණු යන්ත්‍රය වත්කම් ලෙස ගෙන නොතිබූ අතර සවිකිරීමේ වියදම් ලෙස කපාහැර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. තවද, දන්දෙනිය ගොවිජන සේවා කාරක සභාවේ ද පිරිවැය රු.60,000 ක් වූ ඇඹිලි සලකුණු යන්ත්‍රය ක්ෂය කර නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය සහ ජංගම නොවන වත්කම් ප්‍රමාණය රු.6,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන බව | ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව වත්කම්වල ස්වභාවය වර්ග කර ගිණුම් ගත කළ යුතු අතර, අදාළ පරිදි ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඌරුබොක්ක, හක්මණ, දෙනියාය, කඹුරුපිටිය සහ මාලිම්බඩ ගොවිජන සේවා කාරක සභාවලට අයත් ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය පිළිවෙලින් රු.50,106ක්, රු.240,020ක්, රු.21,118 ක්, රු.28,833 ක්, රු.28,555 ක පොලිය ගණනය කර ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ ජංගම වත්කම් ප්‍රමාණය එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද විල්පිට සහ දෙයියන්දර ගොවිජන සේවා කාරක සභාවල රු. 19,160 ක් සහ රු.183,912 කින් ස්ථාවර තැන්පත් පොලී ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | කාලච්ඡේදයට අයත් ස්ථාවර තැන්පතු සඳහා පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කළ යුතුය. |
| (උ) | ගිණුම් ප්‍රමිති අනුව ආදායමට එරෙහිව වියදම් හිලව් කර නොදැක්විය යුතු වුවද මොරවක ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ගිණුම් තැබීමේදී එහි ආදායම රු.857,955 ට එරෙහිව රු.106,752 ක අක්කර බදු දිරි දීමනා සහ රු.160,950 ක් ප්‍රධාන කාර්යාලයට සියයට 20 ක අක්කර බදු හිලව් කිරීමෙන් අනතුරුව ශුද්ධ අගය වූ රු.590,431 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගෙන තිබුණි. තවද අක්කර බදු උපචිත පදනමින් ගිණුම් තබා නොතිබුණි. එමෙන්ම, ආදායම් වියදම් ගිණුම් තැබීමේදී වියදම් හිලව් කර නොදැක්විය යුතු වුවද කිරින්ද පුහුල්වැල්ල ගොවිජන සේවා කාරක සභාවේ ද සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම රු.282,695ක් වුවත් එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ රු.196,127 ක් ලෙස වියදම් අඩුකර ශුද්ධ අගය දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | අක්කර බදු ආදායම් උපචිත පදනමින් ගිණුම් තැබීමටත්, ආදායම් වියදම් ගිණුම් තැබීමේදී ආදායමට එරෙහිව වියදම් හිලව් කර නොදැක්වීමටත් කටයුතු කළ යුතුය. |
| (ඌ) | දෙනියාය ගොවිජන සේවා කාරක සභාවේ පෙර වර්ෂවල නිකුත් කර මාස 06ක් ද ඉකුත්ව තිබූ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ රු.76,640 ක චෙක්පත්, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා | එකඟ වෙමි. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේදී මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ මධ්‍යස්ථාන විෂය නිලධාරී දැනුවත් කරන ලදී. මෙම චෙක්පත් 2018,2019 සහ 2008 | කල් ඉකුත් වූ චෙක්පත් නැවත ආදායමට ගැනීමේදී නිවැරදි කාලච්ඡේදයට අදාළව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂවල නිකුත් කළ චෙක්පත් වේ. | |
| (එ) | විල්පිට ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු ආදායම රු.209,200 ක් වුවද මුදලින් ලද රු.111,429 ක් පමණක් ආදායම ලෙස ගැනීම නිසා රු.97,771 කින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. තවද, දෙයියන්දර ගොවිජන සේවා කාරක සභාවේ ද සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු ආදායම රු.295,550 ක් වුවද මුදලින් ලද රු.369,257 වර්ෂයේ ආදායම ලෙස සැලකීම නිසා රු.73,707 කින් වර්ෂයේ අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | සමාලෝචිත වර්ෂයට අයත් ආදායම් හඳුනාගෙන එම වර්ෂයේදීම ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඒ) | මාලිම්බඩ ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ කාමර කුලී ආදායම රු.66,000 ක් වුවද එය රු.42,000 ක් ලෙස රු.24,000 ක් අඩුවෙන් දක්වා තිබීමෙන් අතිරික්තය සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | සමාලෝචිත වර්ෂයට අයත් ආදායම් හඳුනාගෙන එම වර්ෂයේදීම ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කළ යුතුය. |
| (ඔ) | අකුරැස්ස ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු ආදායම රු.296,800 ක්ව තිබූ අතර එය රු.354,459 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.57,659 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | - එම - |
| (ඕ) | මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ ධාරණ අගය ශුන්‍යව තිබූ, එකතු පිරිවැය රු.614,651 ක් වූ ස්ථාවර වත්කම් 50 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතියත් එම වත්කම් වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | ස්ථාවර වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | මැද උයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ වත්කම් ශේෂ රු.435,503 ක් සහ වගකීම් ශේෂ රු.15,284 ක් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | අනුමැතිය සහිතව ගිණුම්ගත කළ යුතු අතර, අනුමැතිය ලබා නොගත් පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ග) | මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂයේදී සහනාධාර පොහොර යටතේ පළාත් සහකාර කොමසාරිස්ට ගෙවිය යුතු රු.4,875,064 ක මුදල එම වර්ෂයේ ආදායමට ගෙන සිදු කර තිබූ වරද ප්‍රවර්ථන වර්ෂයේදී හෝ නිවැරදි කර වගකීම් ලෙස නිරූපනය කර නොතිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | නිවැරදිව ගිණුම්වල ගලපා එම මුදල ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු, වර්ෂයේ ඉලක්කගත අක්කර බදු ආදායමින් සියයට 20 කට සමාන මුදල රු.38,080 ක් වුවද එය රු.58,229 ක් ලෙස ගෙන තිබීමෙන් වෙනස රු.20,149 කින් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | නිවැරදි අගයන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය. |
| (ට) | වැලිගම ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවියයුතු යූරියා සහ MOP විකුණුමෙන් ලැබී තිබූ රු.2,000,000 ක් සමුච්චිත අරමුදලට ගැලපීම නිසා ගෙවිය යුතු යූරියා සහ MOP ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | ගෙවිය යුතු ගිණුම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඩ) | කිරින්ද පුහුල්වැල්ල ගොවිජන සේවා කාරක සභාවේ, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවැති පොහොර තොගය රු.1,920,420ක් හා MOP තොගය රු.3,201,300 ක්ද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති පොහොර තොගය රු.173,100 ක් හා MOP තොගය රු.2,776,440 ක්ද මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | වර්ෂය ආරම්භයේ සහ අවසානයේ තොග වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | | | |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 ක ගිණුම් විෂයයන් 15 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ගිණුම් ශේෂ වටිනාකම හා එයට අදාල අනුරූපී වාර්තා අනුව දක්වා තිබූ වටිනාකම අතර රු.777,977 ක නොසැසදීම් පැවතුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | ගිණුම් ශේෂ හා අනුරූපී වාර්තා අතර නොසැසදීම් සඳහා හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 22 කට අයත් වටිනාකම රු.26,876,340ක් වූ ගිණුම් විෂයයන් 121ක් තහවුරු කර ගැනීමට අදාලව අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම ශේෂ විගණනයේ දී පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟ වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීමට අදාළ විගණනයට ඉල්ලූ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| | (i) 30(1) (2) (3) (4) හා (5) වගන්ති | යොමුගත වගන්ති ප්‍රකාරව වගාකළ හැකි සෑම කුඹුරු ඉඩමක්ම වී වගාව සඳහා යෙදවිය යුතු අතර වී වගාකළ නොහැකි අවස්ථාවකදී කොමසාරිස් ජනරාල්ගේ අවසරය ලබා ගැනීමෙන් පසු බහු වාර්ෂික නොවන භෝග හෝ අර්ධ වාර්ෂික භෝග හෝ දීර්ඝකාලීන භෝග වගා කළ හැකිව තිබුණද ගොවිජන | එකඟ වෙමි. පුරන් කුඹුරු නිවැරදිව හඳුනාගෙන අස්වැද්දීමට 2025/26 මහ කන්නය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී. දැනට 2025 යල කන්නයේ අක්කර 380ක් අස්වද්දා ඇත. | විධිවිධාන ප්‍රකාරව වගාකළ හැකි සෑම කුඹුරු ඉඩමක්ම වී වගාව සඳහා යෙදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවා බල ප්‍රදේශ 22ක පවතින පුරන් කුඹුරු අක්කර 13,990ක් වගාකරවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | | |
| | (ii) 56 (3) (4) | කාරක සභා 20 ක සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයකර ගැනීමට පැවති රු.3,399,538 ක අක්කර බදු මුදල ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තලල්ල, මිරිස්ස හා කිරින්ද යන කාරක සභාවල හිග අක්කර බදු අයකර ඇත. අනෙකුත් සභාවල හිඟ අක්කර බදු අයකරවීමට ඉදිරියේ දී කටයුතු කරමි. | කාලීනව අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, පැහැර හරින ලද මුදල් අයකර ගැනීමට පනතේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| | (i) මු.රෙ. 110 | කාරක සභා 22 හිම හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබුණි. | එකඟ වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| | (ii) මු.රෙ. 751,752 | කාරක සභා 22 හිම ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. | එකග වෙමි. මධ්‍යස්ථාන වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සම්බන්ධ විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට පියවර ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මු.රෙ. 757(2) (අ) (ආ) හා (4) | යොමුගත රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛ | | | |
| (i) 2016 සැප්තැම්බර් 08 දිනැති අංක 7/2016 දරන චක්‍රලේඛය | සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආශ්‍රිතවම කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | කොම්පොස්ට් පොහොර වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක නොවන නිසා නිෂ්පාදන කටයුතු සිදු නොකෙරේ. එම මධ්‍යස්ථාන වල අලෙවිසැල් වෙනම නොමැති නමුත් කෘෂි ද්‍රව්‍ය අලෙවි කටයුතු සිදු කෙරෙන බව | සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආශ්‍රිතවම කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභාවක දෛනිකව අතරදවා ගත හැකි මුදල් සීමාව රු.10,000ක් වන නමුත්, කාරක සභා 03ක් විසින් සමාලෝචිත වර්ෂයේ තුළ දින 07ත් 49ත් අතර දින ගණනක දී දෛනික මුදල් ශේෂය රු.10,500ත් රු. 1,381,855 ත් අතර ප්‍රමාණයකින් අත රඳවා ගෙන තිබුණි. | එකඟ වෙමි. ප්‍රයෝගික අපහසුතා නිසා බැංකු යාමට නොහැකි තත්ත්වයක් පැවති බැවින් මුදල් තැන්පත් කිරීම ප්‍රමාද විය. ඉදිරියේ දී එසේ නොවීමට කටයුතු කරමි. | අනුකූලතාවය පවත්වා ගෙන යාමට පියවර ගත යුතු අතර, කාලීනව මෙම මුදල් උපරිම සීමාව ප්‍රමාණවත් නොවේනම් එය සංශෝධනය කරගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (iii) 2019 සැප්තැම්බර් 08 දිනැති අංක7/15/18/ සෝ.වි/පොදු/ තා.ගො. ලිපිය | ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හා ගොවිජන සේවා මධ්‍යාස්ථාන මඟින් පාලනය වන ඉඩම්වල ඇති දැවමය /ආර්ථිකමය වටිනාකමින් යුත් ගස් අංකනය කර | එකග වෙමි. ඉදිරියේ දී එවැනි ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | දැවමය /ආර්ථිකමය වටිනාකමින් යුත් ගස් අංකනය කර ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර, එසේ කර නොමැති |

| | | | |
|---|---|---|---|
| | ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි | | පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාරක සභා 20ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.9,695,976 ක අතිරික්තයක්ද, කාරක සභා 2ක රු.590,844 ක ඌණතාවයක්ද වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ කාරක සභා 16 ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.10,100,340 ක අතිරික්තයක්ද, කාරක සභා 06 ක රු.851,542 ක ඌණතාවයක්ද විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ශයේ කාරක සභා 22 හි සමස්ත මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.143,666 ක ශුද්ධ පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරික්තව ඇති මුදල් ඵලදායීව ආයෝජනය කර වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු නොකර මොරවක, මඩිහගොඩගම, පස්ගොඩ, අකුරැස්ස, බෙරලපනාතර, කඹුරුපිටිය, සහ විල්පිට යන ගොවිජන සේවා කාරක සභා විසින් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම කාරක සභාවේ මාසික සියලු වියදම් දැරීමෙන් පසු එකතු වටිනාකම රු.11,135,181 ක් ජංගම ගිණුම් වල රඳවාගෙන තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී එම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරමි. | මුදල් නිෂ්කාර්යව තබා නොගෙන විධිමත් අනුමැතිය යටතේ උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා යොදාගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කාරක සභා 17 ක සාමාජිකයින් 77 දෙනෙකු අනුයාත කාරක සභා රැස්වීම් වාර තුනක් ඉක්මවා සහභාගිවී නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන පනතේ 51(6)(ඇ) (I) හා (II) වගන්තිය ප්‍රකාරව ඔවුන්ගේ පත්වීම් අවසන් කර ඒ වෙනුවට වෙනත් තැනැත්තන් කාරක සභා සඳහා පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු කර නොමැති පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 17 ක වසර 2 ත් 30 ත් අතර කාල පරාසයක් තුළ | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු | අයවිය යුතු ශේෂ කාලීනව අය නොකළ |

| | | | |
|---|---|---|---|
| | නිරවුල් කර නොගෙන පැවත එන එකතුව රු.5,902,128 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂ 61 ක් හා වසර 2 ත් 33 ත් අතර කාල පරාසයක් තුළ නිරවුල් නොකර පැවත එන එකතුව රු.5,079,128 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ 64 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබුණි. | කරමි. | පාර්ශව වෙත පියවර ගැනීමටත්, දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන අයවිය යුතු ශේෂ කඩිනමින් අය කිරීමටත්, ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් තම රාජකාරි සම්බන්ධයෙන් මාසික ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් ඉදිරිපත් කළ යුතු නමුත්, මාලිම්බඩ ගොවිජන සංවර්ධන කාරක සභාවේ සේවය කරනු ලබන නිලධාරීන් 05 දෙනෙකු විසින් කළ වැඩ සටහන් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | එකඟ වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මාසික ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් ඉදිරිපත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | මොරවක ගොවිජන සේවා කාරක සභාවේ අත්ට්‍රැක්ටරය 2014 වර්ෂයේදී බදු දී තිබූ අතර බදු ගත් තැනැත්තා විසින් 2019 ජනවාරි 07 දින ආපසු භාරදී තිබුණි. අත්ට්‍රැක්ටරය ආපසු භාරදෙන අවස්ථාවේදී ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව සඳහන් කර තිබුණ ද එදිනෙන් පසු විගණන දිනය වූ 2025 පෙබරවාරි 07 දින දක්වා වසර 06 ක කාලය තුළ මෙම අත්ට්‍රැක්ටරය සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කිසිවක් ගොනුවෙහි ඇතුළත් කර නොතිබුණු අතර එය නිශ්ක්‍රීය වත්කමක් ලෙස මධ්‍යස්ථාන ගරාජය තුළ දිරාපත් වෙමින් පවතින බව ද නිරීක්ෂණය විය. | විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | වත්කම් භාවිතා කිරීමෙන් තොරව දිරාපත් වීමට ඉඩ හැර ඇති නොසැළකිල්ල හා අකාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහි විනයානුකූල කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වැලිගම ගොවිජන සේවා කාරක සභාවේ කාබනික පොහොර අංශය ක්‍රියාක්මක වී නොතිබුණු අතර, වෙනත් පොහොර, එළවළු බීජ, පැළ හා කෘෂි උපකරණ වල දළ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 60ක් 95ක් 30ක් හා 83කින් අඩු වී තිබුණි. එසේම කාරක සභාවේ සමස්ත ලාභය මුළු ආදායමෙන් සියයට 4ක පමණ ඉතා අඩු දායකත්වයක් ගෙන තිබුණි. | විෂය නිලධාරියා කැඳවා මෙම වැරදි හා අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව | කාබනික පොහොර අංශය ක්‍රියාත්මක කිරීමටත් ඒ අනුව ලාභදායිත්වය ඉහළ නංවා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 4 ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 20 කට අයත් ගොවි බැංකු 20 ක් විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය හා කෘෂි ණයවලින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අයවිය යුතු එකතුව රු.50,483,874 ක ණය ශේෂය කල්පසු වී තිබුණි. එම ණය අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | එකග වෙමි. 2025.09.30ට කල්පසු වූ ණය 35,249,445 ක් දක්වා අඩු කර ගෙන ඇත. | කාලීනව ණය අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, බැංකු ණය අදාළ කාලය තුළ අයකර ගැනීමටත්, අතර ව්‍යාපෘති ණය ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි උපයෝජනය කරවීමටත්, ගොවීන් උනන්දු කරවිය යුතුය. |
| (ආ) | ගොවි බැංකු විසින් වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 ක් ගොවි ආපදා ණය ආවරණ ගිණුමට වෙන් කළයුතු නමුත්, කඹුරුපිටිය ගොවි බැංකු විසින් එසේ සිදුකර නොතිබුණි. ඒ අනුව කල්පසු වූ ණය අවදානම් කළමණාකරණය කිරිම, ගොවීන් වෙත ප්‍රතිලාභ ලබාදීම හා ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ තිරසර බව සුරක්ෂිත කිරීමේ අරමුණෙන් පවත්වාගෙන යායුතු මෙම අරමුදල විධිමත් පරිදි ක්‍රියාත්මක නොකිරීම තුළ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමේ අවදානමක් නිරීක්ෂණය විය. | එකග වෙමි. මෙම වර්ෂයේ 10% ක ආපදා ණය, ණය ආවරණ ගිණුමට වෙන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |